සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 40 S

පෙරදිග සංගීතය - I කොටස | කාලය පැය දෙකයි

විභාග අංකය ................................................

● සැළකිය යුතුයි:- ප්‍රශ්න සියල්ලටම පිළිතුර සපයන්න.
ප්‍රශ්න අංක 1-10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සප්තකයට අයත් සියලු ම ස්වර ප්‍රකෘති , විකෘති වශයෙන් කීයද?
1. 2 කි. 2. 5 කි. 3. 7 කි. 4. 12 කි.

02. සඩ්ජය හා පංචමය ස්වර හඳුන්වනු ලබන්නේ,
1. චල ස්වර නමිනි 2. අචල ස්වර නමිනි
3. ශුද්ධ ස්වර නමිනි 4. විකෘති ස්වර නමිනි

03. ස්වර සප්තක 7 ක් පමණ යොදා ඇති යතුරු පුවරු සහිත සංගීත භාණ්ඩයකි.
1. හාර්මෝනියම් 2. මෙලෝඩිකා 3. පියානෝව 4. එකෝඩියන

04. බටහිර සංගීතයේ E Flat ($E^{\flat}$) යන සංකේතයෙන් දැක්වෙන පෙරදිග සංගීතයේ ස්වරය කුමක් ද?
1. ග̇ 2. ග̣ 3. ග̲ 4. ග

05. මන්ද්‍ර ස්වර හැඳින්වීම සඳහා
1. ස්වරයට උඩින් තිතක් තබයි. 2. ස්වරයට යටින් ඉරක් අඳියි.
3. ස්වරයට යටින් ඉරක් හා තිතක් තබයි. 4. ස්වරයට යටින් තිතක් තබයි.

06. "බැතිනා සිරිපා .................." යන ශුද්ධ ස්වර සහිත ගී පාදය
1. ළමා ගීතයකි 2. බැති ගීතයකි
3. ස්වරස්ථාපන ගීතයකි 4. කෙළි ගීතයකි

07. දාදරා තාලය වාදනය සඳහා සුදුසු තාල වාද්‍ය භාණ්ඩය වන්නේ
1. රබාන 2. තාලම් පට 3. තබ්ලාව 4. බෙරය

08. "මොනවද මුත්තේ මොකද කරන්නේ" යන ළමා ගී පාදයේ මාත්‍රා බෙදෙන්නේ
1. මාත්‍රා 2/4 ලෙසය 2. මාත්‍රා 4/4 ලෙසය
3. මාත්‍රා 3/3 ලෙසය 4. මාත්‍රා 2/3 ලෙසය

09. තාලම් පටින් නිකුත්වන ධ්වනි හඳුන්වන්නේ
1. තිත්, තෙයි 2. ලඝු, ගුරු 3. විලම්භ, මධ්‍ය 4. සම්, බලි

10. තනි තිතේ ප්‍රභේද තුන පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. සුළු, මැදුම්, මහ 2. මැදුම්, සුළු, මහ
3. මහ, සුළු, මැදුම් 4. සුළු, මහ, මැදුම්

● ප්‍රශ්න අංක 11 - 15 දක්වා වරහන් තුල දී ඇති පිළිතුරු වලින් තෝරා හිස්තැනට සුදුසු වචනය ලියන්න. එක් පිළිතුරක් එක් අවස්ථාවකට පමණක් යොදා ගන්න. (රබාන, සර්පිනාව, වයලීනය, තබ්ලාව, බටනලාව)

11. ................................................. තත් හතරකින් යුත් ස්වර වාද්‍ය භාණ්ඩයකි.

12. තූර්ති සංගීතයේ දී අවනද්ධ භාණ්ඩයක් ලෙස තබ්ලාව හා ස්වර පුවරු භාණ්ඩයක් ලෙස ......................................
...................... යොදා ගැනේ.

13. ....................................................... සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් වේ.

14. "රත්නදීප ජන්මභූමි" ගීතය සඳහා සුදුසු හින්දුස්ථානී තාල වාද්‍ය භාණ්ඩය ........................................................ වේ.

15. විරිඳු ගායනයේදී භාවිතා වන අවනද්ධ භාණ්ඩය ................................................................ වේ.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුල යොදන්න.**

16. "අඹ දඹ නාරං ...." යන ගීතය ශ්‍රී වික්‍රම රාජසිංහ නූර්ති නාට්‍යයේ ගීතයකි. (    )

17. ලඝු අකුරක වටිනාකම මාත්‍රා එකකි. (    )

18. දාදරා තාලයේ මාත්‍රා සංඛ්‍යාව හයකි. (    )

19. සිතාරය හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩයකි. (    )

20. තබ්ලාව ස්වර වාද්‍ය භාණ්ඩයකි. (    )

# II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) i. පෙරදිග සංගීතයේ භාවිතා වන ප්‍රකෘති, විකෘති ස්වර වෙන් කර ලියන්න. (ල. 02)
ii. ඔබ උගත් ශුද්ධ ස්වරස්ථාපන ගීත අතුරින් ස්වර තුනකට වැඩියෙන් යෙදෙන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(02) i. ස්වර පුවරුවක් ඇඳ විකෘති ස්වර 05 ලකුණු කරන්න. (ල. 06)
ii. ස්වර පුවරු සහිත සංගීත භාණ්ඩ 04 ක් නම් කරන්න. (ල. 04)

(03) i. දේශාභිමානී ගීත දෙකක් නම් කරන්න. (ල. 02)
ii. ඔබ කැමති දේශාභිමානී ගීතයක පද මාලාව ලියන්න. (ල. 08)

(04) I. නූර්ති ගීතයක පද මාලාව ස්ථායි අන්තරා කොටස් ඇතුලත් වන සේ ලියන්න. (ල. 08)
ii. නූර්ති නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

(05) i. දාදරා, ලාවනී, ත්‍රිතාල් යන තාල වලින් එකක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.(ල. 08)
ii. රබාන, උඩරට බෙරය, තබ්ලාව, පහතරට බෙරය යන භාණ්ඩ වලින් එකක දළ රූප සටහනක් අඳින්න. (ල. 02)

# පළමු වාර පරීක්ෂණය - 2019
## පෙරදිග සංගීතය
07 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

## I කොටස

| | |
|---|---|
| 1 - 4 | 11 - වයලීනය |
| 2 - 2 | 12 - සර්පිනාව |
| 3 - 3 | 13 - බටනලාව |
| 4 - 3 | 14 - තබ්ලාව |
| 5 - 4 | 15 - රබාන |
| 6 - 3 | 16 - ( ✗ ) |
| 7 - 3 | 17 - ( ✓ ) |
| 8 - 2 | 18 - ( ✓ ) |
| 9 - 1 | 19 - ( ✓ ) |
| 10 - 1 | 20 - ( ✗ ) |

(ලකුණු (1 x 20 = 20 )

## II කොටස

(01) I. ප්‍රකෘති ස්වර 7
විකෘති ස්වර 5 } ලකුණු 1x2 = 02

ii. ස්වරස්ථාපන ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය
පද ප්‍රස්තාරය } ලකුණු 4x2 = 08

මුළු ලකුණු 10

(02) I. විකෘති ස්වර - රි ග ම' ධ නි ලකුණු කිරීමට - ල. 05
ස්වර පුවරුව ඇඳීමට - ල. 01

ii. සංගීත භාණ්ඩ 04 නම් කිරීමට - ල. 04
පියානෝව, සර්පිනාව, මෙලෝඩිකාව, ඕගනය

} ලකුණු = 10

(03) i. දේශාභිමානී ගීත දෙකක් නම් කිරීමට - ල. 02
ii. පද මාලාවට - ල. 08 } ලකුණු = 10

(04) I. නූර්ති ගීතයේ ස්ථායි පද මාලාව - ල. 04
අන්තරා පදමාලාව - ල. 02 } ලකුණු = 10
ii. නූර්ති නාට්‍ය දෙක නම්කිරීමට - ල. 02

(05) I. තාලයේ - යේබාවට - ල. 04
තාල සංඥා - ල. 04

ii. රූප සටහන - ල. 02

} ලකුණු = 10